
# මල්කිගේ මල් වත්ත



තෙනුරි මෙත්සලා

මල්කිගේ මල් වත්ත

කර්තෘගේ නම : තෙනුරි මෙත්සලා

කතෘගේ වෙනත් කෘති : තාරකීගේ සිහිනය

5 - A , මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර

ISBN Number : 978 - 624 - 208 - 808 - 2

2025. 02. 08

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකිග ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසායග එසේ නම් මහාමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයිග දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයිග පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත් කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකිග ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකිග ඉන් ඔබ්බට මෙවර පාසල් ප්‍රජාවට ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිම්පාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමු කරන හෙරණගත්කරණී ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට වියග මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවන් රටේ පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහනයක් ද වෙයි ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හදුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය

ශශිකලා සේනාධීර

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

ඒකමත් එක කාලෙක මල්කි කියල පුංචි ගැහැණු ළමයෙක් සිටියා. අද ඇයගේ පාසල් නිවාඩුව ලැබෙන දවස. ඇය ළමයින් සමඟ ඒ ගැන කතා කරමින් පාසල් ඇරී සතුටින් ගෙදරට ආවා.



ඇය කොච්චර දුප්පත් වුණත් ඇයට ලස්සන මල් වත්තක් තිබුණා. ඈ පාසල් ඇරී ආ ගමන් නා ගෙන කෙලින් ම ඇයගේ මල් වත්ත ළඟට ගොස් මල් වලට වතුර දැම්මා. ඇයගේ මල් වත්ත දැක ඇයට හුඟක් සතුටු හිතුණා.



ඊළඟ දවසේ ඇය වතුර දැමීමට ගිය වේලාවේ කවුද කෙනෙක් වත්තට පැමිණ මල් ඔක්කොම නෙලාගෙන ගිහින් තිබුණා. ඇය එන විට මල් වත්තේ මල් ඔක්කොම අතුරුදහන් වෙලා.

ඇයට පුදුම හිතුණා. ඒ වගේම ඇයට දුක හිතුණා. ඇය මිදුලේ ගලක වාඩි වී ඒ ගැන සිතුවා. ඇය ගෙදර යන්න පිටත් වුණා. ඊළඟ දවසේ ඇය අම්මා ළඟට ගොස් සිද්ද වූ දේ පැවසුවා. අම්මාටත් ඒ ගැන පුදුම හිතුණා.

එදා රාත්‍රියේ මල්කි නිදාගෙන ඉන්න වෙලාවේ මල් වත්ත පැත්තෙන් එළියක් ආවා. මල්කි ඇහැරුණා. මල්කි ඒ එළිය ජනේලයෙන් දැක්කා. ඒ වෙලාවේ මල්කි ජනේලය ඇරලා බැලුවා.

මල්කිට ඒ වෙලාවේ කිසිම දෙයක් දක්නට ලැබුණේ නෑ.

මල්කිට ඒ වෙලාවේ හුඟක් බය හිතුණා.



ඇය ජනේලය වහලා ආයෙත් නිදාගන්න ඇඳට ආවා.

නමුත් ඇයට නින්ද ගියේ නෑ. ඇය මල්වත්තට වෙච්ච දේ ගැන කල්පනා කළා. ඊට පස්සේ එහා පැත්තේ ඇඳේ සිටි අම්මා මෙහෙම කිව්වා.

"ඇයි දුව ඔයාට නින්ද යන්නෙ නැද්ද? තාමත් හිතන්නේ අර මල් වත්ත ගැනද? ඔව් අම්මේ මට ඒක ගැනමයි මතක් වෙන්නේ" කියල මල්කි කිව්වා.

"ඒ ගැන හිතන්න එපා දුව මම ඒ ගැන තාත්තට කියල බලන්නම්." "හරි අම්මේ" මල්කි කිව්වා.

ඊළඟ දවසේ ඇය උදේම කඩේකට ගොස් මල් පැළ වගයක් රැගෙන ආවා. ඩාස්පෙතියා, රෝස සහ පිච්ච යන පැළ මල්කි මල් වත්තට ගෙනාවා. ගෙනත් මල් වත්තේ හිටෙව්වා. මල්කිගේ අම්මා ජනේලයෙන් දැක්කා.

"දුව මොනවද කරන්නේ?" අම්මා එළියට ගොස් ඇහුව්වා. "අම්මේ මම මල් පැළ වගයක් ගෙනත් හිටෙව්වා."

"ආ ඒක හොඳයි මමත් උදව් කරන්නම්" කියලා අම්මා කිව්වා. "ඒකනම් හොඳයි අම්මේ" කියලා මල්කි කිව්වා.



මල්කි රාත්‍රියේ දී කෑම කන්න කෑම මේසයේ ඉදගත්තා. තාත්තා ද එතන පුවත්පතක් කියවමින් හිටියා. මල්කි ආ පසු තාත්තා පුවත්පත මේසය උඩින් තිබ්බා.

"දුව ඔයාගේ මල් වත්තේ කලින් මල් ගොඩක් තිබ්බා. ඒත් මේ දවස්වල මල් පොඩ්ඩයිනේ?"

"ඔව් තාත්තේ" කියලා මල්කි කියනවාත් එක්කම අම්මා එතනට ආවා. අම්මා මෙහෙම කිව්වා.

"අනේ බලන්නකෝ අපේ දුවගේ මල් වත්තේ මල් ඔක්කොම කවුද කඩන් ගිහින්."

"ඒක තමයි මමත් මේ දුවගෙන් විමසුවේ." තාත්තා කිව්වා.

ටික දිනක් ගෙවී ගියා. එක් දිනක රාත්‍රියේදී සුරංගනාවියක් මල්කිට කතා කළා. මල්කි ජනේලයෙන් කවුදැයි බැලුවා. හරිම ලස්සන රෝස පාට ගවුමකින් සැරසුණු ඉතා ප්‍රීතිමත් සුරංගනාවියක් ඇය දුටුවා.

ඇය සුරංගනාවිය දුටු ගමන් ගෙදර දොර ඇරගෙන එළියට ආවා. සුරංගනාවිය මෙහෙම කිව්වා.

"මල්කි මට සමාවෙන්න. එදා මන් ඔයාව හැමතැනම හෙව්වා. ඔයා හිටියේ නැති හින්දා මන් ඔයාගේ මල් වත්තෙන් මල් ටිකක් කඩාගෙන ගියා."

"අනේ ඒකට කමක් නෑ. ඔයාට ඕන වෙලාවක මගේ මල් වත්තෙන් මල් කඩන් යන්න" කියලා මල්කි කිව්වා. "

"එහෙනම් කමක් නෑ …… නොකියා ඉන්න එක හරි නැති හින්දයි මම අද ආවේ. එහෙනම් මම ගිහින් එන්නම්" කියලා සුරංගනාවිය කිව්වා.


"එහෙනම් පරිස්සමින් යන්න" කියලා මල්කි කිව්වා.



මල්කිට එදා රාත්‍රියේ හරිම සතුටුයි. මල්කි සුරංගනාවිය ගිය පසු දොර වසා කාමරයට ආවා. මල්කිට සතුට වැඩිකමට නින්ද ගියෙත් නෑ. පහුවදා උදේම මල්කි රාත්‍රියේ වෙච්ච දේ ගැන අම්මා සහ තාත්තා ට කිව්වා.



ඇයගේ අම්මාට සහ තාත්තාට ඒ ගැන අසා හරිම සතුටුයි. කාලය ගෙවී යනවාත් සමඟම මල්කිට පාසල් යන කාලය උදා වුණා. මල්කි සතුටින් මල් වත්තත් රැකගෙන ජීවත් වුණා.



# නිමි !



**පසුවදන.**

රටේ අනාගතය සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධ අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ත ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමුලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකිග එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වාර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප පළාත් ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි. මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය දියණියන් ගුරුභවතුන් දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකියග මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි එම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමටම හාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නියග සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිස පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂිංසනය.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක

සෙනෙවිරත්න

මහලේකම්